# මම සහ මාගේ මනස



සනුකි තෙන්නකෝන්

මම සහ මාගේ මනස

සනුකි තෙන්නකෝන්

ISBM - 978-624-208-238-7

# පිදුම

මා මෙලොවට දායාද කොට ජීවිතය පුරා මා දෙස නෙත්
යොමුකරමින් මාගේ දුක සැප දෙකෙහි මා තනි නොකර
ආදරයෙන් මා රැකගන්නා මගේ ආදරණීය මෑණියන් වූ සඳරු
තෙන්නකෝන් ට ගෞරවයෙන්, භක්තියෙන් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# I කොටස

මාගේ ජීවිතයේ මා ලබපු ඉතාම සුන්දර අත්දැකීම මගේ ළමා කාලයයි. මගේ මනසින් ඒ ළමා කාලයට එබිකම් කලොත් මට නිතර දැනෙන චරිත කිහිපයක් ඒ තුල සැරිසරන බව මට දැනෙයි. හැමදාමත් මගේ හෙවනැල්ල මෙන් සිටින මගේ අම්මා ඉන් ප්‍රමුඛ ස්ථානය ලබනවා. මගේ ජීවිතයේ මගෙ ලගින්ම ඉන්න ඊළඟ චරිතය මගේ අත්තම්මා. මගේ හැම වැඩකටම ඇගිලි ගහනවා කිවුවොත් ඒක නිවැරදියි. හා හා දුවන්ඩ එපා වැටෙයි. උඩ නගින්ඩ එපා, බිමට වැටෙයි. බල්ලා එක්ක සෙල්ලම් කරන්ඩ එපා උෟ හපයි. පූසා අල්ලන්ඩ එපා නහයට මයිල් ගිහින් ලෙඩ වෙයි. මිදුලෙ නටන්ඩ එපා දූවිල්ල වැඩියි. ඔන්න ඔහොමයි මගේ අත්තම්මා. ඒ කොහොම උනන් මම හරිම ආදරෙයි මගේ අත්තම්මට.

මම පෙර පාසැල් යන කාලයේ මගේ ළඟින්ම හිටියේ ඉතා කුඩා මිතුරු සංඛ්‍යාවක්. මම හරිම ආසාවෙන් පෙර පාසැල් ගියේ.

මට අද වගේ මතකයි. මම ගුවන් සේවිකාවකගේ චරිතයට ඇතුල්වෙමින් උත්සවයක පිළිගැනීමකට සිටි අවස්ථාවක්. එදා මම පුංචි වේදිකාවකට නැග පිළිගැනීමේ කථාව කළා. ක්‍රීඩා උත්සව

වල හැම ඉසවුවකටම ක්‍රීඩා කළා. එදා ඒ පුංචි මනසේ කිසිම දුකක් තනිකමක්, වේදනාවක් තිබුණේ නැහැ. මට හැම දේම ලැබුණා. මම සතුටු උනා. මගේ පෙර පාසැල් සමයේ මිතුරන් අදටත් මට හමු වෙනවා. ඒ කාලය ඉතාම සුන්දරයි.

පෙර පාසැල් කාලය නිම වෙනවාත් සමගම මගේ අම්මාගේ හීනය උනේ මාව හොඳම බාලිකා විදුහලට ඇතුලත් කිරීමයි. මගේ අම්මා ආදි ශිෂ්‍යාවක් නිසා හැමදාම පාසැලේ දියුණුව උදෙසා වැඩකළ බව අදටත් ඇය පවසනවා.

මගේ අත්තම්මාත් මෙහි ආදී ශිෂ්‍යාවක් ඉතින් ඒ දෙන්නාගේම හීනය වුණේ මාවත් එම පාසලට ඇතුලත් කරන්න. ඒ හීනය හැබෑ වුණා. මගේ 1 වසරේ ඇරඹෙන්නේ ප්‍රාථමිකයෙන්. මම ඒ දිනවලත් ඉතාම සතුටින් පාසල් ගියා. වැඩ කළා. මගේ ගුරුතුමිය අපි සියලු දෙනාටම ආදරෙන් ඉගැන්නුවා. ඇත්තෙන්ම ඒ කාලයත් ඉතාම සුන්දරයි. ක්‍රීඩා උත්සව, කුඩා මිතුරි උත්සව, ත්‍යාග ප්‍රධානෝත්සව, භක්ති ගීත, සිල් සමාදන්වීම, විවිධ ප්‍රසංග යන මේ සෑම උත්සවයක්ම ඉතාම විශිෂ්ඨ ලෙස පැවැත්වූවා. මාගේ ප්‍රාථමික පාසල් දිවිය සතුටින් ගෙවී ගියා.

ඒ කාලය ඉතාම සුන්දරයි. නිවාඩු කාලයට මගේ ලොකු මාමා අපි හැමෝම ලස්සන රටකට ගෙන යනවා. ඒ කාලයේ මට ඒ විදේශ සංචාරවල වෙනසක් නොදැනුණි. යන්තම් එම සංචාර මගේ මතකයට එන්නේ හීන මෙනි. නමුත් ඒවා සැබෑ වූ හීන බව මට දැන් දැනේ. වරක් දෙවරක් අපි ජපානයේද සංචාරයේ යෙදුනෙමු. ඒ සංචාරවලදී ගුවන් ගමන් යද්දී අත්තම්මා මාව ළඟින්ම තියා ගනියි. මුහුදු තීර වල සෙල්ලම් කරන ලස්සන සුදු ළමයි දුව පනිමින්, පිහිනමින්, නටන හැටි මගේ හිත තුලට ආවාට මගේ අත්තම්මා මට බිමටවත් බහින්න දුන්නේ නැති බව මට දැන් මතකයට එනවා.

මගේ අත්තම්මා මුහුදට බයයි. වතුරට යන්න බයයි. පාලම් වල යන්න බයයි. කතුරු ඔන්චිල්ලා වල උඩට යන්න බය බයයි. ඒ නිසා වෙන්න ඇති මාවත් වඩාගෙන මට බිමටවත් බහින්න නොදී මාව පරිස්සම් කලේ.

මාගේ අම්මා එයාගේ පාසැල් කාලයේදී ඉතාමත් දඟයිලු. එයා පීනන්න ආසයි. දුවලා පැනලා සෙල්ලම් කළ බව නිතර කියනවා. පාසලේ ක්‍රීඩා උත්සවවල දුවලා උස පැනලා, දුර පැනලා ලබා ගත්ත සහතික දැනටත් ඇය ළඟ තියෙනවා. අම්මාගේ පාසල් සමය ඉතාම සුන්දර බව ඇය නිතර පවසනවා. අපේ අම්මාට අයියලා දෙන්නෙකු සිටින නිසා ඇය තනිකමක් නොදැනුණු බව

නිතර පවසනවා. ඇගේ පාසැල් මිතුරියන් බොහෝ සිටින බවත් ඒ අය ඉතාම සුහද ලෙන්ගතු බවත් කියන්නේ ඉතාම සතුටින් අදටත් ඒ මිතුරියන් නිතර ඇයට කතා කරනවා.

මගේ අත්තම්මාත් ඇයට පාසල් ජීවිතය, ඇගේ විශ්ව විද්‍යාල ජීවිතය ගැන විස්තර නිතර මා හා පවසනවා. අදටත් ඇගේ පාසල් මිතුරියන් ඇයට කතා කරනවා. විනෝද චාරිකා යනවා. සුහද හමු පවත්වනවා. ඒ ගැන කියමින් සතුටු වෙනවා.

පරම්පරා තුනක ජීවිත කතා මොනතරම් වෙනස් ද?

මගේ ළමා කාලය සුන්දර උනත් දැන් මම ලොකුයි. මම 6 වසරට යනවා. ප්‍රාථමිකයෙන් ලොකු පාසලැට. ශිෂ්‍යත්වයෙන් සමත් වී වෙනත් පාසැල් වලින් ළමයි අපේ පාසලට එනවා. ඒ කාලෙට මට තරමක් අපහසු කාලයක් වන්නේ මට ශල්‍යකර්මයකට මුහුණ දෙන්න සිදුවෙනවා. එය තරමක් ලොකු ශල්‍යකර්මයක් බව මට දැනුනා. මට මාස 5ක් පමණ පාසල් යාමට පවා නොහැකි වුවා. මගේ පාසැල් වැඩ බොහොමයක් අතපසු වුණා. පැය 5ක් පමණ සිහි නැති කළා. ඒ කාලසීමාව මට ඉතාම දුෂ්කර, වේදනාකාරී බවක් ගෙන දුන් කාලයක්.

ටිකෙන් ටික ලොකු උනා. මට දැන් අවුරුදු 15යි. මගෙ ජීවිතයේ ඉතාම වේදනාකාරී කාලය මේකද?

පුංචි මල් කැකුළු විකසිත වී පිපෙනකොට මොනතරම් ලස්සනද මම දැන් යොවුන් වියට පිවිසෙමින් සිටිමි.

8 වසර මම ජීවිතයේ ආසම පන්තිය. මගේ ආදරණීයම ගුරුතුමිය මට එදා හමුඋනා. මාව වෙනස්ම මගකට පිවිසුනා වගේ මගේ මනසට දැනුනා. මගේ ආදරණීයම ගුරුතුමිය චමරි මැඩම්. ඉතාම ලෙන්ගතුයි. මට අම්මා ළඟ ඉන්නවා වගේ දැනුනා. වැරදි කරන විට හැමෝටම එක විදියයි. ඒ වෙලාවට අපිට බනිනවා. ඒ උනාට අපිට ආදරෙයි. ඇයත් අපේ විද්‍යාලයේම ආදි ශිෂ්‍යාවක්. ඇගේ පාසල් ජීවිතයේ රසවත් සිද්ධි අප හා පවසනවා. අප හරිම ආසයි ආසාවෙන් ඒ කතාව අහන්න.

මට අළුත් ජීවිතයක් ලැබුණා වගේ ඒ පන්තියට ගියවිට මට දැනුනේ. මට අසනීප උන නිසා අතපසු වූ පාඩම් බොහෝය. නමුත් නැවත මගේ ජීවිතය හදාගන්න චමරි මැඩම් මට ගොඩක් උදව් කළා. මගේ ගුරුතුමිය මට ''මෙන්න ඔයාට මැණික් කැට දෙකක්ම ඉන්නවා.'' කියලා මට යාළුවෝ දෙන්නෙක්ම මගේ ළඟින්ම ගෙනත් ඉන්න සැලසුවා.

මගේ මේසේ මැද මගේ දෙපැත්තෙන් ජයෝ සහ පිනි දෙන්නම පාඩම් වැඩ වලට හරිම දක්ෂයි. මට බැරි උන විෂයන් සියල්ලම කියල දෙනවා. මාව පොත් කියවන්න උනන්දු කරනවා. ජයෝ පොත් කියවන්න හරි ආසයි. මටත් පොත් කියවීමේ ආශාව ඇතිකලේ ජයෝ. දෙන්නම පංතියේ ඉහළම තැනක. මමත් ඒ දෙන්නා එක්ක හරි හරියට වැඩ. මම තමයි උදෙන්ම පන්තියට එන්නෙ. බුදු පහන භාර මටයි. තෙල් මල් හඳුන්කූරු හැමදාම මම ගෙනාවා. උදේම බුදු කුටිය පිරිසිදු කළා. පන්තියෙ හැම වැඩකටම මම උනන්දු උනා. මම ලකුණු වැඩියෙන් ගත්තා. පොත පතට තිබුණු ආදරය ලැදියාව වැඩි උනා. ගෙදර ගිය වෙලාවෙ ඉඳන් අත පසුවූ වැඩ, ගෙදර වැඩ මේ සේරම ඉතාම ආසාවෙන් මම කළා.

අපේ පන්තියට මුළු පාසැලෙන්ම පළවෙනියට ස්මාර්ට් බෝඩ් එකක් ගෙනාවා. ඒක ගේන්ඩ වැඩිපුරම මහන්සි උනේ අපේ අම්මා. මුළු පංතියම එයට දායක උනා. හැමෝම තමන්ට හැකි පමණින්, ආසාවෙන් එයට ආධාර දුන්න. චමරි මැඩම් සතුටින් ඉපිල ගියා.

හැමෝටම ස්තූතියි. 8 වසර

අපි ජය ගත්තා.

අපේ විනෝද චාරිකාව සීගිරිය අපේ පන්ති 7 ම එයට සහභාගි වුණා. ඒකනම් හරිම විනෝදයි. අපි සිංදු කිව්වා, නැටුවා පරිසරය නරඹුවා සියලු දෙනාම එකසේ සතුටු වුණා.

වාර විභාග මම සතුටින් මුහුණ දුන්නා. වසර පුරාම මම හිටියෙ හරිම සතුටින්. අපි කවදාවත් තරහ උනේ නෑහැ. බැරි දේවල් කියලා දුන්නා. එකමුතුකම අපි අතරට ආවා. ලෙඩක් හැදුනත් හැමෝම බලනවා. ඒ පාසලේ පැය 6 ගෙවෙනවා දැනුනෙවත් නැහැ. වසර අවසන් උනා. අපි අලුත් පන්තියට ගියා.

ඒ 9 වසර පටන් ගැනීම. අපි ඒ පන්තියෙත් එකට හිටියා. පළමු වාරය වෙනදා වගේම. ඉතාම සතුටින් උද්යෝගයෙන් ගෙවිලා ගියා. දෙවැනි වාදය පටන් ගත්තා. අපේ පන්තියෙ තවත් ළමයෙක් අපි අතරට ආවා. අපි තුන්දෙනා ටික ටික ඈත් උනා. මගෙ හිතට සදාකාලික වධදුන් ඒ දවසෙ මට අද වගේ මතකයි. මට දුකයි. අපි තුන්දෙනා අතරට ආපු අළුත්, යාලුවා ඒ තමයි සෙනෝ......

සෙනෝ අපි හැමෝම වෙන්කළා. මට ටික ටික වෙනස්කම් වෙන්න පටන් ගත්තා. මම ඉවසුවා. ඒත් සමහර සිද්ධි මට දරාගන්න බැරි උනා. නොයෙකුත් දේ මට සිදුඋනා. මට ඒ ප්‍රශ්න වලට මුහුණ දෙන්න බැරි උනා. නිතරම මගේ හිත අවුල්. පංතියේ ප්‍රශ්ණ

ගුරුතුමියත් අතරටත් ගියා. මට ඉඳගන්න පුටුවක්වත් නැති උනා. මම යන යන තැනින් මගේ පොත් බෑගය පවා විසිකරන්න තරම් කෙනෙක් සාහසික උනා.

මම අම්මටවත්, මගේ ඇත්තම්මටවත් මේ දේවල් කිවුවෙ නැහැ. මම හොඳටම දන්නවා ඒ දෙන්නා මේ දේවල් දැනගත්තා නම් දුක් වෙනවා. මට මේ දේවල් දරාගන්න අමාරුයි. මගේ දිග කොණ්ඩෙන් අදිනවා. ඒ ළමයා දකිනකොටත් මට කලන්තය හැදෙනවා. මාව කැරකෙනවා. මට හුස්ම හිරවෙනවා වගේ දැනෙනවා.

එදා පාසැලේ බාලදක්ෂ පදක්කම් පැළඳවීමේ උත්සවය. මම වේදිකාව උඩ හිටියෙ හරිම අමාරුවෙන්. උත්සවය යන අතර මට කලන්තය වගේ. මාව වැටෙන්න යන බව දැනුනා. මගේ මිතුරියන් දෙදෙනෙක් මාව අල්ලගත්තා. මාව ගෙනියනවා විතරයි. මට මතක මම සික් රූම් එකේ. මට මොකද උනේ. මගේ අම්මා ආවා. මාව ගෙදර ගෙනාවා. මට හුස්ම ගන්න බැහැ. මාව ගැහෙනවා. වැටෙනවා. ගෙදර තියාගන්න බැහැ.

නොවැම්බර් 23 දා. මගේ ජීවිතයේ අමතක නොවන දුක්බර දවසක්. මාව විශේෂඥ වෛද්‍යවරයෙක්ට පෙන්නුවා. මාව

පෞද්ගලික රෝහලකට ඇතුල් කළා. වෛද්‍යවරු කිහිප දෙනෙක් මාව පරීක්ෂා කළා. මගේ නෑදෑයො මගේ වටේ ඉන්නවා. විනාඩි 10 න් 10 ට වගේ මට හුස්ම හිරවෙනවා. අනේ කාටවත් මේ වගේ ලෙඩක් නම් හැදෙන්ඩ එපා. මගේ මනස පුරා දුවන්නේ මට කරදර කරපු මගේ යාලුවගේ රුව.

ඒ සිද්ධි මතක් වෙන හැම වෙලාවකම මට හුස්ම ගැනීමේ අපහසුතාව කලන්තය හැදෙනවා. දිගින් දිගටම මේ රෝගය උත්සන්න වෙනවා. අනේ මට මොකද උනේ. මාසයක් ගියා දෙකක් ගියා. මගේ වෙනසක් නැහැ. මට මේක දරාගන්න අමාරුයි. මගෙ හිත මටම එපා වෙලා. මගෙ ජීවිතය මට එපා වෙලා. කවදාවත් මේ වගේ දුකක් හතුරෙක්ටවත් වෙන්ඩ එපා කියලා. ඇයි ඒ අම්මට කියන්න බැරි දුවට මේ දේවල් කරන්න එපා කියලා.

අපේ අම්මා මගෙ ඒ කරදර කරන යාළුවගෙ අම්මට මේ විස්තරේ කියලා තිබුණා. එතකොට ඒ අම්මා කිවුවලු මගේ දුව හරි Strong. ඔයාගෙ දුව එහෙම නැතුව ඇති කියලා. මට මගෙ අම්මා ඒක කිව්වම දුක හිතුනා. එක දවසක් ඒ අම්මා මගේ අම්මට කියලා තිබුණා ''මගේ දුවට යාළුවෙක් නැහැ. එයා තනියෙම ඉන්නෙ. හරිම දුකෙන්. ඔයාගෙ දුවට කියන්න'' කියලා. මගෙ අම්මා එදා

මට කිව්වා. පවු ඒ ළමයා තනියෙන්ලු ඉන්නෙ. ඔයාලා ළඟට ගන්න කියලා.

ඒ තමයි සෙනෝ අපි අතරට ආපු විදිය. අපි එකට කෑම බෙදාගෙන කෑවා. එයාගෙ අම්මට වැඩ ගොඩයි. සමහර වෙලාවට මගෙ අම්මා එයාටත් කෑම යවනවා. අපි එකටම ඉඳලා තමයි එයා ටික ටික මගෙ යාළුවන්ගෙන් මාව ඈත් කළේ. මගෙ මුළු ජීවිතයම මට අපායක් කළේ ඒ යාළුවා. මම අම්මටවත් මේ ගැන කිවුවෙ නැහැ.

මේ සිද්ධි මගේ ගුරුතුමියටවත් මම කිවුවේ නෑ.

ඒ ප්‍රශ්ණය හැමදාම මගෙ හිතට කරදර දුන්නා.

10 වසරට ආවා මට මේ කිසිම දෙයක් දරාගන්න අමාරුයි. මට පන්තියේ ඉඩක් නැහැ. මගෙ දිහා ළමයි බලන්නේ අමුතු විදිහට. මගෙ විදුහල්පතිතුමියට මේ සිද්ධිය දැනගන්න ලැබිලා. මගේ ගැන ඉතාම හොඳින් ආදරයෙන් එතුමිය බැලුවා. කිසිම නමක් නොකියා පොදුවේ මට හිංසා කරන්න එපා කියන පණිවුඩය එතුමිය පංතියට දැනුම් දුන්නා.

මගේ පංතිභාර ගුරුතුමිය මාව ආදරයෙන් රැක බලාගත්තා. මොනයම් හේතුවකින් හෝ සිද්ධියකින් හෝ මට හිංසා කරපු ඒ යාළුවා වෙනත් පංතියකට ගිහින්. දැන් එයා නැති එක මට සැනසීමක්.

නියෝජ්‍ය විදුහල්පතියතුමිය මට නැවත මේසයක්, පුටුවක් ලබා දුන්නා.

10 වසරට ගිය අලුත මට දැන් හොඳයි, දැන් මම ත් ආයෙම හිත හයිය දරුවෙක්. හැමදාමත්ම මගේ යටි හිත මට එහෙම කියනවා. මම ආසාවෙන් පාසලටගියා. ළමයි හැමෝම මගේ දිහා බලනවා. මේ තමයි 10 වසර මගේ පළමු දිනය. මගේ යාලුවෝ මගේ දිහා බලන්නේ අළුතින් පංතියට ආපු ළමයෙක් දිහා බලනවා වගේ.

අනේ මට නම් ලොකු ප්‍රශ්නයක්. ඇයි මේ ළමයි මගේ දිහා අමුතු විදිහට බලන්නෙ. මගෙ දිහා බලනවා විතරයි. කිසිම ලෙන්ගතුකමක් නැහැ. වචනයක්වත් කතා කරන්නේ නැහැ. හරියට අමුතු සතෙක් දිහා බලනවා වගේ.

කවදාවත්, කාටවත්ම මෙහෙම වෙන්ඩ නම් එපා. මට ආසාවකට කවුරුම හරි මට එක වචනයක් කථා කරනවා නම්. ඒක මගෙ හිතට මොනතරම් සතුටක්ද? මට ආයෙමත් අසනීප වෙනවා වගේ දැනෙනවා.

මහා කාන්තාරයක වතුර නැතුව අතරමං උන දරුවෙක් වගේ. මේ යාළුවො ඇයි මට මෙහෙම කරන්නේ. අනේ අම්මේ මට ආයෙත් පරණ සිද්ධි මතක් වෙනවා. මම ගෙදර ඇවිත් අඬනවා.

ඉස්කෝලේ ළමයි මාව කොන් කරනවා. ඒ වගේ කිය කිය මම අඬනවා. යාළුවො මාව කොන් කරනවා අම්මේ. මම ඇඬුවා. අම්මා මං ගාවිමන් හිටියා. අම්මා මගෙ හිත හදනවා. ''යාළුවො ඕනෙම නැහැ. ඒ ගැන හිත හිත වධ වෙන්න එපා.'' ඔයාට මම ඉන්නවා. අත්තම්මා ඉන්නවා. ඔයාගෙ ටීචර් ඔයාට මොන තරම් ආදරේද. ප්‍රින්සිපල් මැඩම් නියෝජ්‍ය මැඩම්. මීඩියා මැඩම් ඔයාට අමාරු උනාම ඔයාව බලනවා. මනෝරි මැඩම් ඔයා ගැන බලනවා. ඔයාට දුක් වෙන්න එපා. මගේ අම්මා මට නිතරම මේ වචන ටික කියනවා. මගේ හිත හදන්න. මගේ ළඟින් ඉන්න එකම එක යාළුවෙක් හිටියා නම් මට ඔහොම වෙන්නේ නැහැ.

අම්මා මාව වෛද්‍යවරයෙක් ළඟට එක්ක ගියා. ඇය ඉතාම කාරුණිකයි. පාසලේ හැම සිද්ධියක්ම ඇය දන්නවා. ඇය මගෙ හිත හදනවා. පාසැලේ ළමයි නිසා මගෙ ඔළුවට දරාගන්න බැරි පීඩනයක් එන බව ඇය පැවසුවා. එවිට කලන්තය හැදෙන බවත් ඇය පැවසුවා.

මගෙ අම්මා මාව ආදරෙන් බලා ගත්තා. මම අඬනකොට එයත් අඬනවා. මට මේ ජීවිතය වැඩක් නැහැ. මම මගේ ජීවිතේට ආදරේ නැහැ. මට එකම එක හොඳ යාළුවෙක් ළඟින් හිටියා නම් මේ වගේ දරාගන්න බැරි දේවල් නොවන බවමගේ වෛද්‍යවරිය කිව්වා.

ඇය දේවා, මගේ ජීවිතයේ වටිනාකම මට කියා දුන්න දේවතාවියක් ඇය. මට අමාරු උන හැම අවස්ථාවකම ඇය පැය ගනන් මට කරුණු කියා දුන්නා. මගේ හිත හැදුවා ''ඔයා නැති උනොත් ඔයාගේ අම්මා ඒක කොහොම දරා ගනියිද?'' ඇය නිතරම මගේ හිත හැදුවා. ඇයට මම හදවතින්ම ස්තූති කරනවා.

කාලය, මුදල් ගැන නොහිතා ඇය මට ප්‍රතිකාර කළා. ආදරය සෙනෙහස රැකවරණය මට මගේ අම්මාගෙන් ලැබුණා.

මගේ අත්තම්මා, ලොකු මාමා, සුදු මාමා නිතරම මං ගැන සොයාබැලුවා. භාති නැන්දා කනා. නැන්දා මගේ අක්කි සෙන් මේ හැමෝම මට ආදරේ කළා. මට ලැබෙන්න ඕන හැම සැපක්ම මට දුන්නා. මම ආසා කරන තැන් වලට මාව එක්ක ගියා. පරිසරය වෙනස් උනාම මට හොඳ වෙයි කියලා හිතලා මගේ අම්මා, අත්තම්මා, ලොකු මාමා, මාව ජපානයට එක්ක ගියා, මම සතුටු උනා. විනෝද උනා. යාළුවෝ මගේත් එක්ක නැති උනාට මම මොනවා හරි තෑග්ගක් එයාල වෙනුවෙන් අරගත්තා. මම සතුටින් හිටියා. ආයි ලංකාවට ආවා.

මට භාවනා කරන්න කිව්වා. එතකොට මගෙ හිතට සැනසීමක් ලැබෙයි කියලා. මම ආසම තැන දළදා මාළිගාව. මම අම්මා එක්ක හවසට දළදා මාලිගාවට යනවා. පහන් පත්තු කරනවා. මල් පූජා කරලා ම ප්‍රාර්ථනා කරන්නෙ. මට හොඳ යාළුවො හමුවෙන්න කියලා. මට පාසල් යන්න ලැබෙන්න කියලා.

මට දුක මගේ අම්මා, ලොකු මාමා, සුදු මාමා මම ගැන හිතනවා. ගොඩක් වියදම් කරනවා. සීමාවක් නැහැ. මම කවද්ද ඒ අයට සතුට සැනසුම ගේන්නෙ.

මම ආයෙම පාසල් යනවා. කවුරු හරි යාළුවෙක් මට උදවු කළොත් තව කෙනෙක් කොහොම හරි ඒ යාළුකම කඩනවා.

විනී, චේති, මේ අය මට ආදරෙන් හිටියා. ඒත් එකපාරටම මට බනිනවා. උදේට Good Morning කියද්දි අහක බලනවා. මට දුකයි. උවි මගේ පුටුව ආයෙම උදුර ගත්තා. මම සහ මගේ මනස කියන්නේ නම් මේ දේවල් කරන එක හොඳ නැහැ කියලා. මගෙ යාළුවෝ වගී, උවී, ජනී මාව සතෙක් වගේ හිතනවා. මාව සතෙක්ට සමාන කරලා හිනාවෙනවා.

ජනී මට ළං වෙනවා. ඒත් ටික කාලයයි. මේ හැමෝටම මාව පේන්නේ දරුණු රෝගියෙන් විදියට. මට ඉවසන්නම බැරි උන වෙලාවට මම විදුහල්පතිතුමිය ළඟට දුවනවා. ඇය ආදරයෙන් මගේ හිත හදනවා. මම විදුහල්පතිනිය ලඟට යනවටත් මගේ යාලුවෝ නරක විදියට මට ඇහෙන්න බනිනවා.

දැන් මම හිත හදාගත්තා යාළුවෝ එපා. මම තනියම මටම ආදරේ කරනවා.

I love your self first ඒක තමයි දැන් එකම දේ

ජානි මට බැන්නා. ඔයා එක්ක හිටියොත් මට ප්‍රශ්න වැඩියි කිවුවා. මට කතා කරන හැම යාලුවෙක්ටම එයා ගිහින් මොනවා හරි කියල මාත් එක්ක කතා කරන එක නවත්තනවා.

ජානී , වගී, උනී, ජානි චේති ජයෝ මේ මගේ හොඳම යාළුවෝ.

අන්තිමටම මට ජීවිතේම එපා උනෙත් මේ අය නිසා නිසා.

මට මගේ වෛද්‍යතුමිය කිවුවා. ඔයාගෙ හිතට එන නරක සිතුවිලි ඔක්කොම පොතක ලියන්න. මම ගෙදර ඉඳන් පොත් පිරෙන්න ලිවුවා. ටික ටික මගෙ නරක සිදුවිලි නැති උනා. මට මේ ජීවිතෙන් වැඩක් නැහැ කියලා හිතුන හැම වෙලාවෙම මම මගෙ අම්මාගේ මූණ මතක් කරගන්නවා. අනේ මගේ අම්මාට මොනවා වෙයිද? නරක කතා අහන්න වෙයි. මේ තරම් හොඳින් මාව බලාගත්ත අම්මව මම ආරක්ෂා කරගන්නවා. මගේ විදුහලේ එකම එක ගුරුතුමියක් මට නරක විදිහට කතා කළා. මම එයාටත් වෛර කරන්නේ නැහැ. අපේ පුංචි හිත් තලන්ඩ පෙලන්න එපා.

මම මගේ පාසලට අගෞරව වෙන කිසිම දෙයක් කරන්නේ නැහැ. මගේ පංති පාර ගුරුතුමිය මම ආදරෙයි හැමදාමත්.

මගේ විදුහල්පති තුමිය, මගේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය ඔබලාගේ ආදරබර වදන්, සිනහමුසු මුහුණු, දෙන අවවාද මට කවදාවත් අමතක කරන්නේ නැහැ. මට ජීවත් වෙන්න, ඉගෙන ගන්න, හිත ශක්තිමත් කරන්න උදව් දුන්න ඔබ හැමෝටම මම ගොඩක් ගරු කරනවා. ඔබ හැමෝටම ස්තුතියි.

මට දුකක්, වේදනාවක් මගේ පන්තියෙ යාළුවන්ගෙන් හිංසාවක් වුන හැම මොහොතකම මට ශක්තිය දෙන මීඩියා මැඩම්, මගේ පන්තිභාර ගුරුතුමිය චාන්දනී ආදරෙයි හැමදාමත් සදාකල්හි මගෙ හදවතේ හිඳීවි හැමදාමත්.

මට මේ පොත ලියන්න මට අදහස් දුන්න මගේ අම්මා මිතුරිය තනූ ඇන්ටී හැමදාම මට ශක්තියක් උනා.

මට කියන්න ලියන්න බොහෝ දේවල් ඇත. මම දැන් ශක්තිමත් මගේ ඉගෙනීම දුර්වල උනා. මට පාඩම් අතපසු උනා. විභාග වලට මුහුණ දෙන්න අපහසු උනා. ඒත් මට අරමුණක් ඇත. ජීවිතය ජයගන්න ඉලක්කයක් ඇත.

කවදාවත් කාටවත් කොන් කරන්න හිතන්නවත් එපා. ඒක දරා ගන්න හරිම අමාරුයි. අපි හොඳින් ඉන්නවා දකින්න අකමැති පිරිස වැඩියි. මගේ අම්මා නිතරම ඒ ගැන කියනවා. ඒ වෙලාවට එතනින් ඉවත් වෙන්න ඒක තමයි හොඳම.

මට දැන් ශක්තිය තියෙනවා. හිත රිදුන හිත බිඳුන කෙනෙක්ට උදව් කරලා ඒ අයගේ හිත හදන්න. ඔබත් එහෙම වෙන්න මම වගේ උන තව ගොඩක් අය මගේම පාසලේ ඉන්නවා. එක මම හොඳටම දන්නවා. තවත් ඒ වගේ අය සමාජයට දායාද නොකරන්න හැමෝම වග බලාගමු.

මානසික රෝහලක නතර කරන්නේ මානසික රෝගියෙක් නෙවේ. ඉතාම නිරෝගී, යහපත් චරිතයක් ඇති ප්‍රියමනාප අනුන්ගේ හිත් දිනාගන්න සමත් කෙනෙකුට හිංසා කරන විට ඇය මනසින් වැටෙයි.

මම ඔබ සැමගේ ඉල්ලා සිටින්නේ කිසිම දවසක කෙනෙකුට හිංසා නොකරන්න කියාය.

මෙහි නම්, ගම් සියල්ල මනඃකල්පිතයි.

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBM - 978-624-208-238-7

රු.350.00